## 05

# උම්මග්ග ජාතකයේ මහෞෂධ පඬිතුමාගේ ප්‍රඥාව රාජ්‍ය පාලනය කෙරෙහි පරිභාවිත ආකාරය පිළිබඳ විමසීමක්

*රුවන්ගිකා හේමමාලි දිසානායක, ජී. ඩබ්.*[1]

ජාතක පොතෙහි දැක්වෙන 547ක් පමණ වූ ජාතක කථා අතර දීර්ඝතර සහ ප්‍රඥාවේ මහිමය විශද වන ජාතක කථාවක් වශයෙන් උමංදාව හඳුන්වා දිය හැකි ය. උමං කර්මාන්තයක් පිළිබඳ මෙහි සඳහන් වීම නිසා උම්මග්ග යන නාමය මෙම ජාතක කථාවට ලැබී ඇති බවට මතයක් වේ. උමංදාව මඟින් විවරණය කරනු ලබන්නේ මහෞෂධ නම් පඬිතුමාගේ ප්‍රඥා මහිමයයි. මහෞෂධයන්ගේ ප්‍රඥා මහිමයෙන් නොවිසඳිය හැකි ගැටලුවක් මිහිපිට නොවූ තරම් ය. උමංදාවෙහි මහෞෂධ චරිතයේ විවිධ පැතිකඩ ඔස්සේ ප්‍රඥාව විශද වන අවස්ථා පිළිබිඹු වේ. සමාජ අවබෝධය මඟින් ඇති වන ප්‍රඥාව හා තර්කානුකූල ප්‍රඥාව මහෞෂධ චරිතයේ නිරන්තරයෙන් දැක ගත හැකි වන අතර රාජ්‍ය පාලනය කෙරෙහි එම චරිතයෙන් විශද වන ප්‍රඥාව මූලික වේ. උම්මග්ග ජාතකය පිළිබඳ ලියැවුණු විචාර හා නිබන්ධ ආදිය ද ඒ හා සම්බන්ධ ප්‍රාථමික මූලාශ්‍රය ද ද්විතීයික මූලාශ්‍රය ද ඇසුරු කර ගනිමින් එකී කරුණ පිළිබඳ ව විමසීමක් කිරීම මෙම පර්යේෂණයේ අරමුණයි. මහෞෂධ පඬිතුමා රජු හා නිරන්තර සම්බන්ධ වෙමින් රාජ සභාවේ කටයුතු කළ බුද්ධිමත් පඬිවරයෙකු නිසා ඔහුගේ ප්‍රඥාව රාජ්‍ය පාලනය විෂය තුළින් බහුල ව විශද වේ. උම්මග්ග ජාතක කථාවේ අවසානයේ දී තම ප්‍රඥා මහිමය තුළින් තම රටත් රජුත් මහජනතාවත් ආරක්ෂා කර තමාත් ආරක්ෂා වන්නේ රාජ්‍ය පාලනය සම්බන්ධයෙන් ඔහු තුළ තිබූ ප්‍රඥාව මැනවින් පෙන්වා දෙමිනි. මෙම කරුණු අනුව පෙනී යන්නේ රාජ්‍ය පරිපාලනය කෙරෙහි මහෞෂධයන් තුළ තිබූ ප්‍රඥා ශක්තිය උම්මග්ග ජාතකයෙන් ඉස්මතු වී පෙනෙන බවයි.

ප්‍රමුඛ පද : උම්මග්ග ජාතකය, මහෞෂධ පඬිතුමා, ප්‍රඥාව, රාජ්‍ය පරිපාලනය, චරිත

*1 ශාස්ත්‍රවේදී (විශේෂ) පළමු වසර. සිංහල අධ්‍යයනාංශය.*